# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,779 — 1961 නොවැම්බර් 22 වැනි බදාදා — 22.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## මිළ පාලන දැන්වීම්

අංකය : කේඇල් 83 දරණ මිළ නියෝගය.

අතිරේක ආහාර ද්‍රව්‍ය උම්බලකඩ හා බොනිටෝෆිෂ්

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සිමියන් විජේරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) වගන්තිය හා කියවෙන 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1950 අංක 29 දරණ මිළ පාලන පණත යටතේ සකස්වූ කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දනට උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි උපරිම තොග මිළ ගණනට මෙයට යාකර ඇති උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් ගණන එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වෙනි තීරයෙහි විස්තර කෙරෙන උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් දළ බර හොණ්ඩරයක් කළුතර දිස්ත්‍රික්කයේ තොග වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(2) 1950 අංක 29 දරණ මිළ පාලන පණත යටතේ සකස්වූ කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් දනට උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ගණනට මෙයට යාකර ඇති උපලේඛනයේ තෙවැනි තීරයේ සඳහන් ගණන එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වෙනි තීරයේ විස්තර කෙරෙන උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ශුද්ධ බර රාත්තලක් කළුතර දිස්ත්‍රික්කයේ සිල්ලර වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්;

(ආ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට, එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිළිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවය);
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;
(ඇ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

2115—ජේ. ඇන්. ආර් 59—6,075 (11/61)

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකුණන විට ඒ විකුණනු ලබන උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 17 වැනි දින පස්වරු 2 ට කළුතර දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

සිමසන් විජේරත්න,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාළක.

## උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය | | 3 වැනි තීරය |
|---|---|---|---|---|
| වර්ගය | | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගර සීමාව තුළ විකිණිය යුතු වැඩිම මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි මිළ | | සිල්ලර වෙළෙන්දෙකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගර සීමාව තුළ විකිණිය යුතු වැඩිම මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි මිළ |
| | | රු. ශ. | | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් | ... ... | 3 65 | ... | 0 04 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය නොහැකිය.

11–950

---

1961 අංක ඇෆ් සී ඇම්/42 දරණ මිළ නියෝගය.

අතිරේක ආහාර ද්‍රව්‍ය
(උම්බලකඩ හෝ බෝනිටෝෆිෂ්)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් වෙල්ලයියා නිට්කුනානන්දන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 වන වගන්තියේ 2 වන උප වගන්තිය සමඟ කියවෙන 4 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව මෙම නියෝගයෙන්—

(1) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස්වුනු මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දකුට තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් වලට මෙයට යාකල දෙවෙනි උප ලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උප ලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල මෙයට යාකළ පළමුවන උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝ ෆිෂ් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

(2) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස්වුනු මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී ශුද්ධබර රාත්තලක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන්වලට මෙයට යාකල දෙවෙනි උපලේඛනයේ තුන්වෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස් වල මෙයට යාකල පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි, වැඩිම සිල්ලර මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් පරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් විකිණීම නොකළ යුතු බවත් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක පළමුවෙනි උප ලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එම උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවරදූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය,

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව),

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) පළමුවෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකුණන විට එම ඒ විකුණනු ලබන උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් දෙවෙනි උපලේඛනයේ දෙවෙනි හා තුන්වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 17 දින අ. භා. 4 ට පුත්තලම දිසාපති කාර්යාලයේදී අත්සන් තබන ලදී.

සී. නිට්කුනානන්දන්,
පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

## පළමුවෙනි උපලේඛනය

1. උම්බලකඩ හෝ බොනිටෝ'පිෂ්.

## දෙවෙනි උපලේඛනය

| | පළමුවැනි තීරය<br>ප්‍රදේශය. | දෙවැනි තීරය<br>කොළඹ නාගරික යේ තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයකට අයකෙරිය හැකි වැඩිම තොග මිළට එකතුකළ යුතු මුදල<br>රු. ශ. | තුන්වැනි තීරය<br>කොළඹ නාගරික යේ සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලකට අයකෙරිය හැකි වැඩිම සිල්ලර මිළට එකතුකළ යුතු මුදල<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | දකුණු පිටිගල් කෝරළයේ ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශය ඇතුළු සියලුම ප්‍රදේශ ... ... | 3 65 ... | 0 04 |
| 2. | පුලිච්චාකුලම, බත්තුළුඔය සහ උඩප්පුව හැර උතුරු පිටිගල් කෝරළය ... ... ... | 3 85 ... | 0 04 |
| 3. | පුලිච්චාකුලම, බත්තුළුඔය සහ උඩප්පුව ඇතුළුව පුත්තලම සහ කඩවත් ... ... ... | 4 05 ... | 0 04 |
| 4. | කලුපිටිය සහ ආණමඩුව ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයන් ඇතුළු සියළුම ප්‍රදේශ ... ... | 4 15 ... | 0 04 |

සැලකිය යුතුයි— ඉහත සඳහන් මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍යය විකිණිය යුතු නියම මිළ නොවේ. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මෙ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

11–1062/1

---

**1961 අංක ඇ'ප් සී ඇම්/43 දරණ මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් වෙල්ලයියා නිටකුනානන්දන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 වන වගන්තියේ 2 වන උප වගන්තිය සමඟ කියවෙන 4 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව මෙම නියෝගයෙන්—

(1) 1961 නොවැම්බර් මස 6 වන දිනය හා අංක 12,742 දරණ ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1961 ඔක්තෝබර් මස 31 වන දිනය හා අංක ඇ'ප්සීඇම්/41 දරණ මගේ ආහාර මිළ නියෝගය මෙම දිනයේ සිට අවලංගු කරමි.

(2) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස්වුනු මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දකුට තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම මිළ ගණන්වලට මෙයට යාකළ දෙවෙනි උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල මෙයට යාකල පළමුවන උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

(3) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස්වුනු මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී ශුද්ධබර රාත්තලක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන්වලට මෙයට යාකළ දෙවෙනි උපලේඛනයේ තුන්වෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල මෙයට යාකළ පළමුවෙනි උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) පළමුවන උපලේඛනයේ සඳහන් ඕනෑම ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ පළමුවන උපලේඛනයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) පළමුවන උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමුවන උපලේඛනයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මාරුකිරීමෙන් බාලකොට කිසිවකු විසින් විකිණීම නොකළ යුතු බවත් නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක පළමුවන උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පහසුවෙන් පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා' යන්නෙන් සලකනු ලබන්නේ ඇවරදූපොයි ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමුවන උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා පළමුවන උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම්:—

(අ) විකුණූ දිනය;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය, බර අනුව;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඇ) වෙළෙඳමේ ස්වභාවය, එනම්, වෙළෙඳම් තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(9) පළමුවන උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම් කිසි දෙයක ඔතනු ලැබෙ නම් එහි මිළත් දෙවෙනි උපලේඛනයේ දෙවෙනි හා තුන්වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 17 දින අ. භා. 4 ට පුත්තලම දිසාපති කාර්‍ය්‍යාලයේදී අත්සන් තබන ලදී.

සී. නිටකුනානන්දන්,
පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

## පළමුවන උපලේඛනය

| | |
|---|---|
| ඇනු (රතුඇනු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) | සුදුරු |
| අර්තාපල් | කහ |
| අර්තාපල් (ඉන්දියානු) මෙට්ටුපාලයම් | කොත්තමල්ලි |
| වියලි මිරිස් :— | පියලි නොකළ උලුඳු |
| එම සන්නම් I වෙනි ශ්‍රෙණිය | මුං ඇට |
| එම සන්නම් II වෙනි ශ්‍රෙණිය | තෝර පරිප්පු |
| එම මුන්ඩු I වෙනි ශ්‍රෙණිය | කඩල පරිප්පු |
| එම මුන්ඩු II වෙනි ශ්‍රෙණිය | වික්පියි |
| එම සන්ටක | සුදු ඇනු (බොම්බේ) |
| එම ජාවා | සියඹලා |

## දෙවෙනි උපලේඛනය

| පළමුවැනි තීරය<br>ප්‍රදේශය | දෙවැනි තීරය<br>කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දළබර භොණ්ඩරයකට අය කෙරිය හැකි වැඩිම තොග මිළට එකතු කළ යුතු මුදල<br>රු. ශ. | තුන්වැනි තීරය<br>කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලකට අය කෙරිය හැකි වැඩිම සිල්ලර මිළට එකතු කළ යුතු මුදල<br>රු. ශ. |
|---|---|---|
| 1. දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශය ඇතුළු සියළුම ප්‍රදේශ— | | |
| (අ) රුපියල් 30 සහ ඊට අඩු ද්‍රව්‍යයන් සඳහා ... ... ... | 1 65 ... | 0 02 |
| (ආ) රුපියල් 30 සිට රු. 100 මිළ වන ද්‍රව්‍යයන් සඳහා ... ... | 2 65 ... | 0 03 |
| (ඇ) රුපියල් 100 වැඩියෙන් මිළ වන ද්‍රව්‍යයන් සඳහා ... ... | 3 65 ... | 0 04 |
| 2. පුලිච්චකුලම, බත්තුළුඔය සහ උඩප්පුව හැර උතුරු පිටිගල් කෝරළේ— | | |
| (අ) රුපියල් 30 සහ ඊට අඩු ද්‍රව්‍යයන් සඳහා ... ... | 1 85 ... | 0 02 |
| (ආ) රුපියල් 30 සිට රු. 100 මිළවන ද්‍රව්‍යයන් සඳහා ... ... | 2 85 ... | 0 03 |
| (ඇ) රුපියල් 100 වැඩියෙන් මිළ වන ද්‍රව්‍යයන් සඳහා ... ... | 3 85 ... | 0 04 |
| 3. පුලිච්චකුලම, බත්තුළුඔය සහ උඩප්පුව ඇතුළුව පුත්තලම සහ කඩවත්— | | |
| (අ) රුපියල් 30 සහ ඊට අඩු ද්‍රව්‍යයන් සඳහා ... ... ... | 2 05 ... | 0 02 |
| (ආ) රුපියල් 30 සිට රු. 100 මිළ වන ද්‍රව්‍යයන් සඳහා ... ... | 3 05 ... | 0 03 |
| (ඇ) රුපියල් 100 වැඩියෙන් මිළ වන ද්‍රව්‍යයන් සඳහා ... ... | 4 05 ... | 0 04 |
| 4. කල්පිටිය සහ ආණමඩුව ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයන් තුලවූ සියළුම ප්‍රදේශ— | | |
| (අ) රුපියල් 30 සහ ඊට අඩු ද්‍රව්‍යයන් සඳහා ... ... ... | 2 15 ... | 0 03 |
| (ආ) රුපියල් 30 සිට රු. 100 මිළ වන ද්‍රව්‍යයන් සඳහා ... ... | 3 15 ... | 0 03 |
| (ඇ) රුපියල් 100 වැඩියෙන් මිළවන ද්‍රව්‍යයන් සඳහා ... ... | 4 15 ... | 0 04 |

සැලකිය යුතුයි.—ඉහත සඳහන් මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍යය විකිණිය යුතු නියම මිළ නොවේ. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

11—1062/2

---

ර/19/1961 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝෆිෂ්)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවියයුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්වුන මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් දළබර භොණ්ඩරයක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම මිළ ගණන්වලට මෙයට යාකළ උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

(2) 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්වුන මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ශුද්ධබර රාත්තලක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන් වලට මෙය යාකළ උපලේඛනයේ හතරවෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන්ගත යුතු බව මෙයින් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වරකට දළබර භොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර භොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබියයුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකුණන විට ඒවා විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනයේ 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 16 වෙනි දින පස්වරු 6 ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබනලදී.

හේ. ඩැ. වීරරත්න,
රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලකතැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය<br>වර්ගය | 2 වෙනි තීරය<br>ප්‍රදේශය | 3 වෙනි තීරය<br>කොළඹ නාගරිකයේ තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයකට අයකෙරිය හැකි වැඩිම තොග මිළට එකතු කළ යුතු මුදල<br>රු. ශ. | 4 වෙනි තීරය<br>කොළඹ නාගරිකයේ ශුද්ධබර රාත්තලකට අයකෙරිය හැකි වැඩිම සිල්ලර් මිළට එකතු කළ යුතු මුදල<br>රු. ශ. |
|---|---|---|---|
| උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් | 1. රත්නපුර පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) කුකුල් කෝරලේ පල්ලේ පත්තු, (ඇ) කුරුවිටි කෝරලේ උඩ පත්තු ... | 3 5 | 0 3 |
| | 2. (අ) කුරුවිටි කෝරලේ පල්ලේ පත්තුව, (ආ) කුරුවිටි කෝරලේ මැද පත්තුව ... ... ... | 2 91 | 0 3 |
| | 3. (අ) නවදුන් කෝරලේ උඩ පත්තු (ආ) නවදුන් කෝරලේ මැද පත්තු, (ඇ) නවදුන් කෝරලේ පල්ලේ පත්තු, (ඈ) කුකුල් කෝරලේ මැද පත්තු ... ... ... | 3 18 | 0 3 |
| | 4. (අ) බලන්ගොඩ නගර සභා ප්‍රදේශය, (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය, (ඇ) මැද කෝරලේ හෙල පල්ලේ පලාත, (ඈ) මැද කෝරලේ හෙල උඩපලාත, (ඉ) කඩවත කෝරලේ උඩුවග්ගම් පත්තු, (ඊ) අටකලං කෝරලේ පන්නිල් පත්තු, (උ) අටකලං කෝරලේ මැද පත්තු, (ඌ) කුකුල් කෝරලේ උඩ පත්තු ... ... | 3 24 | 0 3 |
| | 5. (අ) කොලොන්නා කෝරලේ කොලොන්නාගම් පත්තු, (ආ) කොලොන්නා කෝරලේ දියපොට ගම් පත්තු, (ඇ) කඩවත කෝරලේ තල්පිටි ගම් පත්තු, (ඈ) අටකලං කෝරලේ දෙපත්තු ... ... | 3 30 | 0 4 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය නොහැකිය.

11-951

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.